රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 36/96

මගේ අංකය : III/0266/2/68/එල්/එම්ජ්-95
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996.12.31 දින.

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානින් වෙත

**ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය -**
**නිවසක් ඉදිකිරීම/ වැඩ අවසන් කිරීමසඳහා ණය - රාජ්‍ය පරිපාලන**
**චක්‍රලේඛ අංක 6/92 හා අංක 15/94**

ඔබේ අවධානය 1992.01.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/92 හා 1994.04.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/94 කෙරෙහි යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/92 හි 11:21 උප වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

11:21 නිවසක් තැනීම සඳහා දැනටම වෙනත් ණය දෙන ආයතනයකින් (වාණිජ බැංකුවකින්) එම නිවස ගොඩනගන ඉඩම බැංකුවට උගස් කර ණය ලබා ගෙන ඇති අවස්ථාවකදී, එම නිවසේ වැඩ අවසන් කිරීම සඳහා රජයෙන්ද ණය ලබා ගන්නේ නම්, වාණිජ බැංකුවෙන් ණය ලබා ගත් කාරණය ද මුදල හා දිනයද එසේ ලබා ගත් මුදල එම කාරණය සඳහාම වැය කළ බව සනාථ කිරීමට සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුය. එම උගස ලියූ නොතාරිස්ගේ නම, ලියාපදිංචි කරන ලද කාර්යාලය හා දිනය ණය ලබා ගත් ආයතනය මඟින් ඉදිරිපත් කළ යුතුය.

රජයෙන් ණය ලබා ගැනීමට පෙර ණයලාභියා විසින් එකී දේපළ , 2 වන උගසක් ලෙස (ඇමුණුම 2 පරිදි) අදළ අමාත්‍යාංශ ලේකම් වෙත උගස් කළ යුතු අතර, එම ඔප්පුව උගස් පණතේ 6 (1) උප වගන්තිය අනුව අදළ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය. ලියාපදිංචි කරන ලද මුල් පිටපත ණය අනුමත කරන බලධාරියා වෙත ඉදිරිපත් කළ පසු ණය මුදල නිදහස් කළ යුතුය. ලියාපදිංචි කළ උගස් ඔප්පුව සුරක්ෂිතව තබා ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතුය.

11:21:1 වාණිජ බැංකුවකින් ලබා ගත් ණය මුදල ආපසු අය කර අවසන් වූ වහාම වාණිජ බැංකුව විසින් එම උගස අවලංගු කර අවලංගු කිරීම අදළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය. එසේ කළ යුතු බව එම මුදල ණයට ගෙන තිබූ නිලධාරියා විසින්, රජය යටතේ වැටුප් ණය අනුමත කරන ලද බලධාරියා මඟින්, තමා ණය ලබා ගත් වාණිජ බැංකුවට දැන්විය යුතුය.

11:21:2 නිවසක් තැනීම සඳහා ඉඩමක් මිලට ගැනීමට හෝ නිවාස දේපලක් අත්පත් කර ගැනීම සඳහා හෝ වසර 02 ක උපරිමයකට යටත්ව වැටුප් ණය ලබා ගෙන ඇති විටෙක එම ඉඩමේම නිවසක් ඉදි කිරීම සඳහා හෝ එසේ තනන නිවසක වැඩ අවසන් කිරීම සඳහා හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/94 අනුව නැවත රජයෙන් ණය ලබා ගන්නේ නම්, එම අවස්ථා 02 දීම ලබා ගන්නා මුළු ණය මුදල සඳහා ඇමුණුම 1 හි සඳහන් පරිදි එක් ඇටර්නි බලයක් පැවරිය යුතුය.

11:21:3 ඉහත 11:21:2 යටතේ කටයුතු කළ යුතු අවස්ථාවකදී ඇටර්නි බලය පැවරීම හා පසු කටයුතු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/92 හි 11:19:2 වගන්ති අනුව කළ යුතුය. මෙහිදී ඇටර්නි බලය පැවරිය යුත්තේ 2 වන වරට ණය ලබා ගත් අමාත්‍යාංශයේ ලේකම් වෙතය.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත
හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම 01

<u>අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලය (දෙවන ණය මුදලක් සඳහා )</u>

.......................................................................... හි පදිංචි .............................................. වන මා සියල්ලන් වෙත ම දන්වා සිටින වග නම් :-

මීට යාකොට ඇති උපලේඛනයෙහි විස්තර කර ඇති දේපලෙශි සහ භූමිභාගයෙහි නිවසක් ඉදිකිරීම /අංග සම්පූර්ණ කිරීම සඳහා (මෙහි මින්මතු දෙවන ණය මුදල යනුවෙන් සඳහන් කරනු ලබන ) රු........................ ක් වන මුදලක්........................ වන දින මා විසින් ණයට ගන්නා ලදුව ඇති බැවින්ද,

එකී දෙවන ණය මුදලට කලින්, උපලේඛණයෙහි වඩාත් පූර්ණ වශයෙන් විස්තර කර ඇත්තාවූද, දේපළ සහ භූමිභාගය මිලට ගැනීම සඳහා (මෙහි මින්මතු පළමුවන ණය මුදල යනුවෙන් සඳහන් කරනු ලබන ) රු. ................... ක් වන මුදලක් ..................... වන දින......................................................................................... ගෙන් මා විසින් ණයට ගෙන ඇති බැවින් සහ මෙකී දිනය වන විට එකී පළමු වන ණය මුදලේ ආපසු ගෙවීමට ඇති හිඟ ශේෂය ......................................... ක් වන හෙයින්ද,

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව මෙහි මින් මතු ජනරජය යැයි සඳහන් කරනු ලබන / නියෝජනය කරන.................................................................................. ලේකම් වන ......................................................................................... නමින් එකී පළමු වන ණය මුදල සඳහා වලංගු කළ නොහැකි ඇටෝර්නි බලයක්.................................................. වන දින මා විසින් ලියා අත්සන් කර ඇති හෙයින්ද,

මා විසින් ජනරජයෙන් ණයට ගන්නා ලද එකී මුල් මුදල, ඒ සම්බන්ධයෙන් ගිවිස ගන්නා ලද පරිදි එම මුදල් මත පොලියද සමඟ ජනරජ සේවයේ සේවා නියුක්තිකයකු වශයෙන් මට ලැබෙන වැටුපෙන්, පඩිනඩිවලින්, මාසික වාරික මඟින් මා විසින් ආපසු ගෙවිය යුතු යයි යෝජනා කොට ඇති හෙයින්ද,

එකී ණය මුදල හෝ ඉන් කොටසක් හෝ ගෙවීමට ඉතිරිව තිබියදී මොනයම් හේතුවක් නිසා හෝ එකී ජනරජය යටතේ වූ මගේ සේවය අවසන් වුවහොත්, එකී දේපළ විකුණා, ණය මුදලෙන් ආපසු ගෙවීමට එවකට ඉතිරිව ඇති මුදල එකී ජනරජයට ගෙවා ඉතිරි මුදල මට හෝ මගේ උරුමක්කාරයන්ට, පොල්ම:කාරයන්ට හෝ අද්මිනිස්ත්‍රාසිකාරයන්ට හෝ ගෙවීමට හැකිවන පරිදි එකී 1 වන 2 වන ණය මුදල් සම්බන්ධයෙන්........................................................... .......................................................................යේ (අදළ අමාත්‍යාංශය ) ලේකම්ගේ නමින් අවංලගු කළ නොහැකි ආටෝර්නි බලපත්‍රයකට අත්සන් කළ යුතු බවට දන් මගෙන් ඉල්ලීමක් කරන ලදුව මා ඊට එකඟව සිටින බැවින්ද, ......................................... හි පදිංචි .................................. වන මා , එකී රුපියල් ....................ක මුදලක් ණයට ගැනීම කරුණු කොටගෙන, මීට යා කොට ඇති උපලේඛණයේ පූර්ණ වශයෙන් විස්තර කර ඇති දේපළ, ඇටෝර්නි බලකරුට කිසියම් හෝ අවශ්‍ය යයි පෙනී යන යම් මිලකට නොහොත් යම් අන්දමකට විකිණීමට, පැවරීමට හෝ හිමි කිරීමට............................. ...................ලේකම් වන.......................................................................... ඔහුගේ අනුප්‍රාප්තිකයන් සහ /හෝ යාවත්කාලීනව එම පදවිය උසුලන තැනැත්තා, මගේ ඇටෝර්නි බලකරු වශයෙන් අවලංගු නොකළ හැකි පරිදි මෙයින් නම් කර සිටින බවත්, සංස්ථාපනය කරන බවත්, පත් කරන බවත් මෙම ලේඛණය සාක්ෂ්‍ය කොට ගෙන සියල්ලක් විසින් දත යුතුය.

එකී ගැනුම් මුදල ලැබුණු කල්හි, ඉඩම් මිලට ගත් තැනැත්තා, තමාගේ උරුමක්කාරයන්, පොල්ම:න්කාරයන්, අද්මිනිස්ත්‍රාසිකාරයන්, සහ පැවරුම්ලාභීන් හෝ එකී ගැනුම්කරු නොහොත් ඉහත කී අය විසින් නියම කෙරෙන වෙනත් අයකු හෝ නමින්, එකී දේපල පිළිබඳ සියළුම අවශ්‍ය හෝ නියමිත හිමිකරුවනට සහ ආරක්ෂණවලට මා වෙනුවෙන් අත්සන් කටයුතු වන්නේය.

එකී දේපොල ද ඒවායේ කුලී සහ ලාභ ප්‍රයෝජනද, ඒවායෙහි හෝ ඒවා පිළිබඳ මගේ සියලුම බුදල් හිමිකම්ද, අයිතිය සහ සම්බන්ධකම්ද, එකී ගැනුම්කරුට ඔහුගේ උරුමක්කාරයන්ට, පොල්ම:කාරයන්ට, අද්මිනිස්ත්‍රාසිකරුවන්ට සහ පැවරුම් ලාභීන්ට සම්පූර්ණ ලෙසත්, සාර්ථක ලෙසත් පැවරීම සහ මාරු කිරීම සඳහා අවශ්‍යයිද, නිසියයිද අවස්ථානුරූපයයි ද පෙනී යන වෙනත් මොනයම් ක්‍රියාවක් වුවද, මෙම ඇටෝර්නි බලය පවරා නොදී තිබිය දී මම ම පැමිණ සිටියේ නම් මා හටම කරන්නට සිදු වෙන පරිදි යථාර්ථයෙන් ඉටු කිරීම සඳහා මෙයින් බලය පැවරේ.

ඉහත සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් මගේ එකී ඇටෝර්නි බලකරු විසින් සපයනු ලබන්නා වූද, පිළිවෙල කරනු ලබන්නා වූද, අත්සන් කරනු ලබන්නාවූද, සියළුම කුවිතාන්සි, නිදහස් කිරීම්, හිමිකර , නීත්‍යානුකූල ලේඛන සහ ආරක්ෂණ ද, කටයුතු, ක්‍රියාවන්, කරුණු සහ දේවල්ද ම විසින් නිසි පරිදි පෞද්ගලිකව හෝ ඒවාට අත්සන් තබනු ලැබුවාක් ලෙසද, පවරනු, භාරදෙනු හෝ පිළිවෙල කරනු ලැබුවාද, ලෙසද, යථාර්ථයෙන් වලංගු ලෙස හා ක්‍රියාත්මක ලෙස පිළිගත යුතු බව මම මෙයින් නියම කොට, ප්‍රශංසා කර සිටිමි.

අගනා ප්‍රතිෂ්ඨාවක් වෙත දෙනු ලබන මෙම ඇටෝර්නි බලය , එකී ණය මුදල් මත ලැබිය යුතු සියලුම මුදල් ආපසු ගෙවා අවසන් වන තෙක් අවලංගු කළ නොහැකි විය යුත්තේය.

මෙම ඇටෝර්නි බලය ප්‍රකාර ස්ථානය සම්බන්ධයෙන් මගේ එකී ඇටෝර්නි බලකරු විසින් නීත්‍යානුකූලව කරනු ලබන කවර දෙයක් වුවද, කලින් කලට මෙන්ම සියලුම කල්හිම බාර ගැනීමටත් ස්ථිර කිරීමටත් මම මෙයින් පොරොන්දු වෙමි.

මා විසින් ලබා ගන්නා ලද පළමු වන ණය මුදල සම්බන්ධයෙන් අත්සන් කරන ලද පූර්ව ඇටෝර්නි බලය, මෙහි සඳහන් දිනයේ සිට, සියලුම කාර්යයන් සම්බන්ධයෙන් අවලංගු සහ බල රහිත බවට පත් කරනු ලැබිය යුතු අතර මා විසින් එකී ජනරජයෙන් ලබා ගන්නා ලද මුළු මුදල (1 වන සහ 2 වන ණය මුදල්) සම්බන්ධයෙන් මෙම ඇටෝර්නි බලය ක්‍රියාත්මක වන්නේය.

මීට සාක්ෂ්‍ය වශයෙන් 19......................... ක් වූ ................................ මස ................ වන දින ම විසින් මෙහි අත්සන් තබන ලදී.

.......................................

අත්සන

සාක්ෂිකරුවෝ :-

1. ..........................................

2. ..........................................